# ප්‍රශ්න තුන අංක 1



**සම්පාදක**

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

**ධර්ම දානය**

රංජිත් මනම්පේරි
ඉන්ද්‍රානි මනම්පේරි
හිරන්‍යා ඉරාෂි මඩපාත
හසන්ත සමන් මඩපාත
කසුන් ඉෂාර මනම්පේරි

# දුවණියට ඔවදන්...


ලැබ ගනු පිණිස වනිතාවට උරුම සුවේ
සංකර පර සිරිත් අපහට උරුම නොවේ
සංවර ගුණය විලිබිය දෙක ඇතිව ලොවේ
හැම මොහොතකම පිවත් විය යුතුය දුවේ

පිටුදැක නිබඳවම කේලම සහ බොරුව
වැඩිහිටි දෙගුරුනට ලබැඳිව ගරු සරුව
කල් ගත කරන විට ගේ දොර වැඩ හුරුව
සැනසුම ලබා ගත හැකිවෙයි දුක දුරුව

විලිබිය රැකෙන ඇඳුමෙන් හෙළ කතට හුරූ
සැරසිය යුතුය නිතරම පන තිබෙන තුරූ
කරමින් දිනපතා ඔබ තෙරුවනට ගරූ
වනිතාවක් වෙයන් කරුණා ගුණය පිරූ

දවසින් දවස සද් දහමට යොමුව ලැම
පත පොත දහම කියවීමෙන් අනගි තම
ආදරණීය දියණිය මගෙ දෙනෙත සම
සුවඳැති මලක් වෙනු මැන මේ සිහල බිම

# 40 වන ජන්ම දින සැමරුම



පූජ්‍ය පාද

# ලග්ගල කල්‍යානවංශ ස්වාමීන් වහන්සේ

## සුභාසිංසනය

බුදු උපතේ ප්‍රතිඵලයක් වශයෙන් ධර්මය ලොවට දායාද විය. ධර්මය අනුව ජිවත් වන සියලු දෙනාට ලොව ලබාගත නොහැකි සම්පතක් නැත. ලොව උතුම් නිර්වාණ සම්පත්තිය පවා ලැබෙන්නේ ධර්මය අනුව ජිවිකාව පවත්වන අයට යි.

මෙම දහම් ග්‍රන්ථය ලිවීමේදී එම දහම් මාර්ගය කුමක් ද ? යන්න හොඳින් පහදා දී ඇත. පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමිපාණෝ කලක් තිස්සේ අපට උපහාර පිණිස ධර්ම දානයක් කළ යුතුයි කියා සිතේ පැවති මෛත්‍රි සංකල්පනාව ඉටු කිරීම් වශයෙන් මාගේ උපන්දිනය වෙනුවෙන් සෙත් මෙත් ප්‍රාර්ථනාවෙන් කරන මේ උතුම් පිංකම සාදර සිතින් අනුමෝදන් වෙමි. ධර්ම ග්‍රන්ථයේ සම්පාදක පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගි සුව දිගාසිරි කෙළවර අමා මහ නිවන් සුව පිණිස මේ උතුම් පින උපකාර වේවා !

මුද්‍රණ වියදම් වශයෙන් කාලය, ධනය ශ්‍රමය වෙන්කළ බොරැල්ලේ මොඩ් ටේලර්ස් අධිපති රංජිත් මනම්පේරි සහ ඉන්ද්‍රානි මනම්පේරි දූ දරුවන් වන හිරන්‍යා ඉරාෂි මඩපාත, හසන්ත සමන් මඩපාත, කසුන් ඉෂාර මනම්පේරි, යන මහත්ම මහත්මීන්ට නිදුක් නිරෝගි සුව දිගාසිරි පිණිසත්, කරන කියන රැකී රක්ෂා කටයුතු දියුණුව පිණිසත් හේතු වේවා ! වාසනා වේවා ! කියා මෛත්‍රි සිතින් ප්‍රාර්ථනා කරමි. මිය පරලොව ගිය සිරිසේන මනම්පේරි පියතුමාටත්, කේ. එම්. පුංචිරාළ පියතුමා ප්‍රධාන ඥාතීන්ටත් අමාමහ නිවන් සුව පිණිස වේවා ! ඔබ අප සැමට සදාකාලික සැප ඇති අමාමහ නිවන් සුව ලැබේවා !

සියලු දෙනා ලොව සැපවත් වේවා !

මෙයට,
කාරුණික,
ලග්ගල කල්‍යාණවංස හිමි

ගල්දුව ආරණ්‍ය සේනාසනය
කහව, අම්බලන්ගොඩ.
2014. 11. 08

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

මෙම අගනා දහම් ග්‍රන්ථය සංස්කරණය කරනු ලබන්නේ "මිලින්ද ප්‍රශ්නය" නමැති පොත් වහන්සේගෙන් ගත් ප්‍රශ්න තුනක් ඇතුලත්වය. එම ප්‍රශ්න තුන නම්,

1. ඥාති ප්‍රේත පින්පෙත් ප්‍රශ්නය
2. සිහින පෙනීමේ ප්‍රශ්නය
3. අකල් මරණ ප්‍රශ්නය යන

ප්‍රශ්න තුන මාතෘකා කර සාදන ලදි. මෙය සංස්කරණය කරනු ලැබුයේ ක්‍රි. වර්ෂ 2010 පෙබරවාරි මාසයේ කොස්ගොඩ දිවියාගල ආරණ්‍ය සේනාසනයෙහිදිය. මුද්‍රණය කිරීම සඳහා අනුග්‍රාහක ශක්තියක් නොලැබුණු නිසා නැවත 2014 සැප්තැම්බර් මාසයේ අම්බලන්ගොඩ ගල්දූව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමයෙහි පිටපත් කර මුද්‍රණය සඳහා සූදානම් කර තබමි.

## ඥාති ප්‍රේත පින්පෙත් ප්‍රශ්නය

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මේ ලෝකවාසී දායකයෝ දන්දි තම තමන් නමින් මිය පරලොව ගියා වූ ඥාති ප්‍රේතයන්ට මෙම දානයෙහි පින්පෙත් ඒ අපගේ ඥාති ප්‍රේතයන්ට අත්වේවා ! යි කියා පින් අනුමෝදනා කරන්නාහුය. ඒ පින් අනුමෝදන් කරපු හේතුවෙන් මදක් හෝ විපාකයක් එකී ඥාති ප්‍රේතයෝ ලබන්නහු ද ? ය" විචාළෝය. "මහරජතුමනි, සමහර ප්‍රේතයන් ලබති. සමහර ප්‍රේතයන් පින් නොලබන්නාහුය. ස්වාමීනී, කිනම් කෙනෙක් පින් ලබත්ද ? කිනම් කෙනෙක් නොලබත්ද ? මහරජතුමනි, එක්සිය තිස් හයක් නිරයන්හි උපන්නා වූ නිරිසත්වයෝ පින්පෙත් හා දුන් බත් නොලබති. ස්වර්ග ලෝකවලට පැමිණියා වූ දෙවියොත් පින් පෙත් නොලබන්නා හ. තිරිසන්

යෝනිගත සත්වයෝත් පින් නොලබන්නාහ. ප්‍රේත යෝනිගත වූ සතර ආකාරයේ ප්‍රේතයන්ගෙන් අනේක වර්ෂ ශත සහස්‍රයෙහි මහදුක් අනුභව කරමින් ඒ ඒ ස්ථානයන්හි වමන, ගර්භමාලාදිය අනුභව කරමින් වාසය කරන්නාවූ වන්තාසික නම් ප්‍රේතයෝද, අනෙක බුද්ධාන්තරයන්හිත් යැපීමට ප්‍රමාණවත් ආහාර පානයන් නොලබමින් සා පිපාසාවෙන් පෙළෙන්නා වූ ඛුප්පිපාසික ප්‍රේතයෝද, දිරාගිය රුක් සිදුරු ඇවිලගත් ගින්දර සෙයින් කුසතුල ඇවිල දවන්නා වූ ගිනි ජාලාවෙන් දැවී දැවී මහාදුක් වේදනා විඳින්නා වූ නිජ්ක්ධාමකණ්හික ප්‍රේතයෝද යන මේ ත්‍රිවිධ වූ ප්‍රේතයෝත්, ඔවුන් වෙනුවෙන් අනුමෝදන් කරවන පින් පෙත් නොලබති. ඥාති, මිත්‍රාදීන් විසින් දුන් දෙයින් යැපෙන්නා වූ ප්‍රේතයෝ එම පින්පෙත් ලබති. පරදත්තුපජීවී වූ ප්‍රේතයෝද සිහි කරන්නාහුම පින් ලබන්නාහුය,'' යි වදාළ සේක.

“ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යම් ප්‍රේතයෙක් උදෙසා දානාදියක් කරන ලද්දේද, එසේ නම් එම ප්‍රේතයෝ පින්පෙත් නොලබන්නාහු නම්, එම හේතුවෙන් දායකයන්ගේ දානය අස්ථානගත වන්නේය. නිෂ්ඵල වන්නේය'' යි කීහ. “මහරජතුමනි, දෙන දානය අඵල නොවන්නේය, අවිපාක නොවන්නේය. එම දානය පිරිනමත දායකයොම, ඵලානිසංසය අනුභව කරන්නාහුය,'' යි වදාළහ. “ස්වාමීනි, එම නිසා මට කාරණයක් අඟවා වදාළ මැනව'' යි කීහ. “මහරජතුමනි, මේ ලෝකයෙහි යම් කිසිවෙක් තමන්ගේ දුර පළාතක සිටින නෑදෑයන් බලන්ට යාමට කැමතිව ආහාර පාන පිළියෙල කොට ගෙන ඥාතීන්ගේ නිවෙස්වලට යති. එවිට එම නෑදෑයෝ නොසිටියොත් එම ආහාර පාන පිළිනොගත්තොත් කරන්නේ මොකක්ද ?''

“ස්වාමීනි, නාගසේනයන් වහන්ස, එසේ ගෙනෙන ලද කිසිවක් අපතේ නොයන්නේය. ගෙනා අයටම හිමිවන්නේය.'' “රජතුමනි, එපරිද්දෙන්ම දායකයෝම ගෙනා දේ භුක්ති විඳින්නේය. තවද රජතුමනි, යමෙක් නිවසකට ඇතුළු වුයේ එම නිවසට ඇතුල් වූ දොරටුව හැර

වෙනත් දොරටුවක් නැත්නම් එම පුරුෂයා එම නිවසින් පිටවන්නේ කෙසේද ? ස්වාමීනි, ඇතුල් වූ දොරටුවෙන්ම පිටවන්නේය" යි කීහ.

"මහරජතුමනි, එපරිද්දෙන්ම දායකයෝම එම දානයේ ඵලය අනුභව කරන්නාහුය" යි වදාළ සේක. ස්වාමීනි, මෙසේ මේ වදාළ කාරණය එසේම වේවා ! මමද එය පිළිගනිමි. දායකයෝම එම දානයාගේ ඵලය අනුභව කරන්නාහුය. එයට අපි විරුද්ධ නැත. ස්වාමීනි, මේ දායකයන් විසින් දෙන ලද්දා වූ මතක දානය ඥාති ප්‍රේතයන්ට පැමිණෙන්නේය. එම ඥාති ප්‍රේතයෝද දානයේ විපාක අනුභව කරති. ඒ හේතුවෙන් ප්‍රාණඝාත කරන්නා වූ රෞද්‍ර වූ සත්ව ඝාතනය කිරීමෙන් ලේ වැගිරුණු වධක චේතනාව වූ චිත්ත සංකල්පනා ඇති යමෙක් බොහෝ සෙයින් ප්‍රාණඝාත කොට දරුණු අකුසල කර්මයන් රැස් කරගෙන, මාගේ මෙම ක්‍රියාවේ විපාකය ඥාති ප්‍රේතයන්ට අත්වේවා ! කියා ඥාති ප්‍රේතයන් ට අකුසල් දෙන්නේ නම්, එම පාප කර්මයේ විපාකය ඔවුන්ට පැමිණේවිද ? රජතුමනි, එසේ අකුසල් නොපැමිණෙන්නේය. "ස්වාමීනි, යමක් කරණකොට ගෙන, කුසල කර්මය පැමිණෙන්නේය. අකුසල කර්මය නොපැමිණෙන්නේය" යි වදාළා වූ එම අර්ථයෙහි එසේ වන්නට හේතුවක් නැත්තේය. එසේ වන්නට හේතුව කුමක්ද ? "මහරජාණෙනි, තොපි විසඳන්නෙකු ඇතැයි සිතා, නොවිචාළ යුත්තක් නොවිචාරව" යි වදාළ සේක. මොන හේතුවක් නිසා අහස එල්ලී ගත හැකි දෙයක් නැතිව නිරාලම්බන වීද ? මොන හේතුවක් නිසා ගංගාවෝ උඩුගං බලා නොයන්නෙහිද ? මොන හේතුවක් නිසා මනුෂ්‍යයෝ දෙපා හිමියන් වීද ? පක්ෂිහුත් දෙපා ඇතියවුන් වීද ? මොන හේතුවකට මෘගජාතිහු සතරපාද ඇතියවුන් වීද ? යි, කියා එම කාරණයත් තෙපි මාගෙන් විචාරන්නෙහිද ? මෙවැනි දේ නොවිචාලව."

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මම ඔබ වහන්සේ වෙහෙසට පත්කිරීම පිණිස ප්‍රශ්න විචාරනවා නොවෙයි. මේ ලෝකයේ බොහෝ මිනිසුන් ආත්මාර්ථකාමීහ. වැරදියට සිතන්නාහ. බුද්ධිය හීනය, අඩු

වැරදි පැත්තම සොයන්නාහ. ඒ අඥානයන්ට එවන් මෝඩ සිතිවිලි නොවන්නට, අසන්නට අවස්ථාවක් නොතැබීම පිණිස, ඔබ වහන්සේගෙන් මෙවන් ප්‍රශ්න අසනවා හැර වෙහෙසට පත්කිරීමේ කැමැත්තක් නැතැයි" කීහ. "රජතුමනි, පාප කර්මය සමග නොකළ කල්හිද, මෙබඳුවූ ප්‍රයෝගයෙන් ප්‍රාණඝාතාදිය කරව, ය කියා නොදත් කල්හිද, පාප කර්මය සමග බෙදා ගන්නට නොහැකි වන්නේය. යම් සේ මනුෂ්‍යයෝ උණබටාමාතිකාදි ජලය ඉසිලීමෙන් ජලය ඈතට ගෙන යති. එසේම මහරජාණෙනි, ඝණ ගල් පර්වත එසේ උණබට දිගේ ඉසිලීමකින් කැමති තැනකට ගෙන යාමට හැකිවේද ? යි" අසා වදාළ සේක. "ස්වාමීනි, එසේ කළ නොහැක. රජතුමනි, එපරිද්දෙන්ම කුසල කර්මය බෙදාගන්නට හැකිවන්නේය. අකුසල කර්මය බෙදාගන්නට නොහැකි වන්නේය. තවද, මහරජතුමනි, පහන්තිර සහ තෙල් දමා පහන් දල්වන්නට හැකි වන්නේය. එසේම රජතුමනි, වතුර දමා පහන් තිර දල්වන්නට හැකිද ? ස්වාමීනි, එසේ කළ නොහැක. මහරජතුමනි, එපරිද්දෙන්ම කුසල කර්මය ඔවුනොවුන්ට බෙදාගැනීමට හැකි වන්නේය. පාප කර්මය එසේ බෙදා ගැනීමට නොහැක."

"තවද මහරජතුමනි, ගොවියෝ ජලාශයන්ගෙන් ජලය හරවා ගෙනගොස් ධාන්‍ය වපුරා ගොවිතැන් කරන්නාහුය. එයාකාරයට මහා සමුද්‍රයෙනුත් ජලය ඇල වේලි මාර්ගයෙන් ගෙනගොස් ගොවිතැන් කළ හැකිද ? ස්වාමීනි, එසේ කළ නොහැක. රජතුමනි, එසේම කුසල් බෙදා ගැනීමට හැකිය. අකුසල් බෙදා ගැනීමට නොහැකි ය. ස්වාමීනි, කුමන හේතුවක් නිසා කුසල් බෙදා ගැනීමටත්, අකුසල් බෙදා ගැනීමට නොහැක්කෙත් මන්ද ? යි මට පහදා දෙන මෙන් ඉල්ලා සිටිමි. මම කිසිවක් නොදන්නා අන්ධයෙක් නොවෙමි. ඔබ වහන්සේ වදාළ දෙයක් අසා දැන ගන්නෙමි" යි කීහ. "මහරජතුමනි, අකුසලය ඉතා ස්වල්ප වන්නේය. කුසලය ඉතා මහත් වන්නේය. ස්වල්ප බැවින් අකුසලය කරන්නා විසින්ම ග්‍රහණය කෙරෙයි කුසලය මහත් බැවින් දෙවියන් සහිත වූ ලෝකයෙහි පැතිරෙන්නේය. ස්වාමීනි, මීටම උපමාවක් කර

වදාළ මැනව" යි කීහ. "රජතුමනි, ජල බිංදුවක් පොළොවෙහි පතිත වන්නේ නම් එම ජලබිංදුව පොළොවෙහි දුරකට ගලා යත්ද ? නැත ස්වාමීනි, යම් තැනක එම ජල බිංදුව පතිත වුව ද එහිම එය සිඳී යන්නේය. රජතුමනි, එය කිනම් හේතුවක් නිසාද ? ස්වාමීනි, ජල බිංදුව කුඩා නිසයි. මහරජතුමනි, එපරිද්දෙන්ම පාපය ඉතා කුඩා වන්නේය. කුඩා නිසා පව් කරන්නාහු ග්‍රහණය කොට හිඳිනේය. අනුන්ට බෙදීමට නොහැකිය. තවද, මහරජාණෙනි, යම් සේ මහත් වූ මහා මේඝයක් සකල පෘථිවි තලය තෙත් කරමින් වසින්නේ නම් මහා මේඝය හාත්පසින් දිසානු දිසාවෙහි පැතිරේද ?"

"එසේය, ස්වාමීනි, එම මහා වර්‍ෂාව හෙල්, විල්, ඇල, දොළ, ගංගා, විල්, පොකුණු, පහත් බිම් සියල්ල පුරවා බොහෝ ප්‍රදේශයක් පුරා පැතිරෙන්නේය. මහරජතුමනි, එපරිද්දෙන්ම පුණ්‍ය කර්‍මය ඉතා බලවත් වන්නේය. එය සියළු දෙව් මිනිසුන්ටත් බෙදන්නට හැකි වන්නේය." යි වදාළ සේක. "ස්වාමීනි, නාගසේනයන් වහන්ස, කිනම් හේතුවක් නිසා අකුසලය කුඩාවීත් කුසලය මහත්වීමක් වන්නේද ?" "රජතුමනි, මේ ලෝකයෙහි යමෙක් බුද්ධාදි උත්තමයන්ට දන් දෙන්නේය, සිල් සමාදන් වන්නේය. පොහොය දිනයන්හි පුණ්‍ය කටයුතුවල යෙදෙන්නේය. එවිට එම පුරුෂයා සතුටු වන්නේය. ප්‍රබෝධමත් භාවයට පත් වන්නේය, ප්‍රසන්න වූ සිතක් ඇති වන්නේය. ඔහුට එය සිහිපත් වන වාරයක් පාසා සතුටක් ඇතිවන්නේය. මහරජතුමනි, යම් සේ බොහෝ වූ පිරිසිදු ජලයෙන් සම්පූර්ණ වූ ළිඳවන්හි එක් දිසාවකින් උල්පත් ජලය ළිඳට ගලා එන්නේ නම්, තවත් දිසාවකින් පිරුණු පැන් නික්ම යන්නේය. එසේ නිරන්තරයෙන් පැන් නික්ම යන කල්හිත් නැවත නැවතත් පිරිසිදු ජලය ගලා එන්නේය. කිසිවෙකුටත් එම ජලය හිස් කරන්ට නොහැකිය. මහරජාණෙනි, එපරිද්දෙන්ම කුසල කර්‍මය නැවත නැවතත් වර්ධනය වන්නේය. එම පුරුෂයා අවුරුදු සියයකට පෙර කරන ලද එම කුසලය සිහි කරන්නේ නම්, සිහිකරන සිහිකරන වාරයක් පාසාම පිරිසිදු ළිඳට පිරිසිදු ජලය ගලන්නා සේම තව තවත්

කුසල් බලය දියුණු වන්නේය. එම පුරුෂයාගේ එකී කුසල් කර්මය යම්තාක් කැමති කෙනෙකුත් සමග බෙදාගැනීමට හැකි වන්නේය, මෙම ප්‍රශ්නයෙහි යම් කාරණයකින් කුසල කර්මය ඉතා බොහෝ වේද්ද, එයටම දැක් වූ මෙම කාරණය යි'' වදාළ සේක.

''මහරජතුමනි, යමෙක් පාප කර්මයක් කරගෙන අජාසත්ත රජතුමා මෙන් පසුව ශෝක වන්නාහ. සිත දුර්වල වන්නේය. ඇකිලෙන්නේය, නොපැතිරෙන්නේය, බිය වන්නේය. තමාම චෝදනාවට පැමිණෙන්නේය. නොවැඩෙන්නේය. එහිම ක්ෂය භාවයට පැමිණෙන්නේය. රජතුමනි, යම් සේ බොහෝ උස් මිටි වූ බොහෝ වැලි ඇත්තා වූ වියළි ගංගාවෙහි වකුටු වූ එක් භාගයකින් ගඟ ඉහළ පටන් ගලන්නා වූ ස්වල්ප වූ ජලය පිරිහෙන්නේය. ක්ෂය වන්නේය. එම ජලය වැල්ලෙහිම සිඳෙන්නේය.''

''මහරජතුමනි, එපරිද්දෙන්ම පාප කර්මය කරන්නාගේ සිත ඇකිලෙන්නේය. වකුටු වන්නේය. පෙරළෙන්නේය, ශෝක කරන්නේය, තැවෙන්නේය, පිරිහෙන්නේය, ක්ෂය වන්නේය, පව් කළ වේලෙහිම ක්ෂය භාවයට පැමිණෙන්නේය. රජතුමනි, මෙම ප්‍රශ්නයෙහිදී යම් කාරණයක් අකුසල කර්මය ස්වල්ප වීද එයටම දැක් වූ කාරණය'' යි වදාළ සේක. ''යහපති ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මෙසේ මෙම ප්‍රශ්නයත් එසේම පිළිගන්නෙමි'' යි කියා වර්ණනා කළහ.

නිමි.

# මහා සවප්න (සිහින පෙනීමේ) ප්‍රශ්නය

වර්තමාන සමාජයේ බොහෝ අය තම තමන් දකින සිහින ගැන නොයෙක් නොයෙක් ආකාරයට සිතන, කියන, සතුටට, දුකට, විචිකිච්ඡාවට, බියට (පත්වීමත්) කොසොල් මහරජතුමා සේ නොයෙකුත් කපටි කෛරාටිකයන්ගේ දෙබිඩි කථාවලට අසුවන නිසා මෙම ප්‍රශ්නයත් සටහන් කරමි.

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මේ ලෝකයෙහි ස්ත්‍රී පුරුෂයෝ, යහපත් වූ ද, පවිටු වූද, පෙරදුටුවා වූ ද, නොදුටුවා වූද, පෙරකළා වූද, නොකළා වූ ද, සැප ඇත්තා වූද, භය සහිත වූ ද සිහින දකිති. ඉතා ඈතයෙහිද, සමීපයෙහිද, බහුප්‍රකාර වූද, නොයෙක් වර්ණ ඇති සිහින දකිති. මෙකී සිහින මොනවාද? මෙකී සහින කවරෙක් දකීද?" යි ඇසූහ.

" මහරජතුමනි, සිතට යමක් අරමුණුව පැමිණේද, මේ සිහිනය නම් එම නිමිත්ත මාත්‍රයෙක, වාත ප්‍රකෘතිවූ පුද්ගලයා අහසින් ගමන් කරන්නා වූ සිහින දකිති. පිත්ත ප්‍රකෘති වූ පුද්ගලයා අග්නි (ගිනි) දාහාදි සිහින දකින්නේය. සෙම් කිපුනාවූ පුද්ගලයා ජලක්‍රීඩාදි සිහින දකින්නේය. අර්ථානර්ථ සාධනු කැමති වූ දෙවියන් විසින් කල්‍යාණ - නපුරු දැක්වීමෙන් සිහින දක්නේය. පෙර පුරුදු කථා සල්ලාප ක්‍රියාදි විසින් සිහින දක්නේය. තමාට මතුවන හොඳ නරක වැඩ පිණිස පූර්ව නිමිති වශයෙන් සිහින දකින්නේය." "මහරජතුමනි, මෙකී භය ආකාරටම සිහින පෙනෙති. මෙකී භය ආකාරයෙන් පෙනෙන සිහින වලින් පූර්ව නිමිති වශයෙන් පෙන්නුම් කරන සිහින පමණක් සැබෑ වන්නේය. අනෙක් ආකාරයට පෙනෙන සිහින සියල්ල හිස්බවට පත්වේ." යයි වදාළ සේක.

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් පූර්වනිමිති වශයෙන් සිහින දකින්නේය. ඒ කෙසේද? ඔහුගේ සිත තෙමේම ගොස් එම නිමිත්ත සොයන්නේද? එම නිමිති ලක්ෂණ හෝ සිත හමුවට ඒද?

එසේ නැතිනම් කිසියම් කෙනෙක් හෝ පැමිණ ඔහුට කියාද?" "මහරජාණනි, ඔහුගේ සිත තෙමේම ගොස් ඒ නිමිති ලක්‍ෂණය සොයන්නේ නැත. වෙනත් කිසිවෙක් ඔහු වෙත පැමිණ කියන්නේද නැත. එම නිමිති ලක්‍ෂණයම සිතට ඉදිරිපත් වන්නේය. මහරජතුමනි, යම් සේ ආදාසය තෙමේම කිසි තැනකට ගොස් ඡායාව සොයන්නේ නැත. වෙනත් කිසිවෙක් විසින් හෝ ඡායාව ගෙනවුත් ආදාසයට නගන්නේද නැත. කිසියම් තැනකින් ඡායාව අවුත් ආදාසයට (කැඩපත නොහොත් කණ්නාඩිය නොහොත් සිතට ඇතුළු කරගන්නා වූ කැමරාව) ඉදිරිපත් වන්නේය. රජතුමනි, එපරිද්දෙන්ම ඔහුගේ සිතම ගොස් නිමිති ලක්‍ෂණය සොයන්නේ නැත. කිසිවෙක් කියන්නේත් නැත. කිසියම් ස්ථානයකින් නිමිති ලක්‍ෂණයම අවුත් සිතට ඉදිරිපත් වන්නේය." යි වදාළ සේක.

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, කිසියම් සිහිනයක් දක්නේද, කුමක් ද සැපතක් හෝ භයක් හෝ වේනම් විපාකයක් වන්නේයයි කියා එම සිත දනීද? රජතුමනි, සැපතක් හෝ බියක් හෝ මෙබඳු විපාකයක් වන්නේය, යි කියා ඒ සිත නොදන්නේය. යමෙකුට එබඳුවූ සිහින ලක්‍ෂණයක් උපන්නේ නම්, එවිට ඔහු අන් අයට කියන්නේය. ඒ අය අතරින් ඥාණවන්ත අය අර්ථ කථනය කෙරෙති" යි වදාළ සේක. "ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් සිහින දකින්නේනම් ඔහු නිදිමතේ දකින්නේද? නැතිනම් නිර්වර්පිතව දකින්නේද?" "රජතුමනි, නිදිමත්ව සිටින්නෙකු සිහින දකින්නේ නැත. නින්දක් නැතිව සිටියදිත් සිහින දකින්නේ නැත. කපිනිදුවට (වඳුරු නින්ද) පැමිණි කල්හි සිත භවංගයට අසම්ප්‍රාප්ත කල්හි සිහින දකින්නේය. රජතුමනි, නින්දට වැටුණු පුද්ගලයාගේ සිත කැදැල්ලට ඇතුළු වූ පක්‍ෂියෙකු මෙන් භවංග ගත වන්නේය. හෘදය වස්තුව නිසා පවත්නා වූ ඒ භාවංගගත සිත කිසිවක නොපවත්නේය. ඒ කිසිවක නොපවත්නා වූ සිත කිසි සැප දුකක් නොදන්නේය. දුක් සැප නොදන්නා සිතට සිහින අරමුණක් නොවන්නේය. සැප දුක් ආදියෙහි සිත පවත්නා කල්හි සිහින පෙනෙන්නේය."

"මහරජතුමනි, කිසි ආලෝකයක් නැති ඝන අන්ධකාරයෙහි ඉතා පිරිසිදු වූ කණ්නාඩියෙහිද ඡායාව නොපෙනෙන්නේය. එපරිද්දෙන්ම නින්දට පැමිණි කල්හි සිත භවාංග ගතව සිටිකල්හිද තුඹසකට ඇතුළු වූ සර්පයෙකු සේ සිත ශරීරාභ්‍යන්තරයෙහිම වන්නේය. අරමුණු සැලකිම් වශයෙන් සිත නොපවත්නා කල්හි සිහින නොපෙනෙන්නේය. මහරජතුමනි, කණ්නාඩිය යම්සේද, එපරිද්දෙන්ම ශරීරය දත යුතුය. අන්ධකාරය යම්සේද, එයාකාරයටම නින්ද දත යුත්තේය. ඡායාව යම්සේද, එමෙන් චිත්තය දත යුත්තේය. තවද මහරජතුමනි, යම් සේ මීදුමෙන් වැසුනා වූ සූර්ය දිව්‍ය රාජයාගේ ප්‍රභාව නොපෙනෙන්නේය. තිබෙන්නා වූ ඒ සූර්ය රශ්මිය නොපවත්නා කල්හි ආලෝකයක්ද නැත. එසේම නින්දට වැටුනු කෙනෙකුගේ සිත භවාංගගත වන්නේය. භවාංගගත වූ සිත දුක් සැප අරමුණක නොපවත්නේය. සිත නොපවත්නා කල්හි සිහින නොපෙනෙන්නේය. මහරජතුමනි, සූර්ය මණ්ඩලය යම්සේද එලෙසම ශරීරය දතයුත්තේය. මීදුමින් වැසියාම යම්සේද එමෙන් නින්ද දතයුත්තේය. සූර්ය රශ්මිය යම් සේද, එමෙන් සිත දතයුත්තේය. දෙදෙනෙකුගේ විද්‍යාමාන වූද ශරීරයෙහි චිත්තය නොපවත්නේය. නිද්‍රොපගතවූ භවාංග ගතයාගෙ විද්‍යාමාන වූ ශරීරයෙහිද, සිත නොපවත්නා ලද වන්නේය."

නිරෝධ සමාපත්තියට පැමිණියා වූ රහතන් වහන්සේගේ ශරීරය විද්‍යාමාන වූ කල්හිද සිත නොපැවැත්මේ වන්නේය. තවද මහරජාණෙනි, නිද්වර්ජිතයාගේ චිත්තය ලොල් වන්නේය. විවෘත වන්නේය, ප්‍රකට වන්නේය, නිබඳ එක අරමුණක නොසිටින්නේය. මෙබඳු වූ සත්වයාගේ සිතෙහි සිහින ලක්‍ෂණයක් ඉදිරිපත් නොඑළඹෙන්නේය. යම්සේ රහස් කියන්නට නුසුදුසු වූ විශ්වාස කළ නොහැකි වූ ප්‍රකට වන ක්‍රියා ඇති පුරුෂයෝ නැතිකරන්නාහුය. රජතුමනි එපරිද්දෙන්ම නිද්වර්ජිත වූවහුට ප්‍රකෘතිමනුෂ්‍ය විෂය නොවන්නා වූ දිව්‍යමය වූ කාරණය අරමුණු නොවන්නේය. එමනිසා නිද්වර්ජිත වූ පුද්ගලායා සිහින දකින්නේ නැත. "තවද මහරජතුමනි, යම්සේ මිත්‍රද්‍රෝහිවූ ගුණධර්ම හීනවූ පාපමිතුරන්

ඇති දුශ්ශීල වූ, කුෂිතවූ, උදාසීන භික්ෂුභුකරා (සත්තිස්බෝධිපාක්ෂික) වූ කුසල් සිතක් අරමුණට නොපැමිණෙන්නේද, එපරිද්දෙන්ම නිදි වර්ජිතයාට දිව්‍ය වූ කාරණයට අරමුණට නොපැමිණෙන්නෙය. එමනිසා නිදිවර්ජිත පුද්ගලයා සිහින දකින්නේ නැත."

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මිද්ධයයි කියන ලද නිද්‍රවගේ ආදියෙක් ඇත්ද? මාධ්‍යයෙක් ඇත්ද? අවසානයක් ඇත්ද?" යි විචාළෝය. "එසේය මහරජතුමනි, මිද්ධයාගේ (සිතෙහි පවත්නා කම්මැළි ගතිය) ආදියත් ඇත, මධ්‍යයත් ඇත, අවසානයත් ඇත." "ස්වාමීනි ඒ කුමක්ද?" "මහරජාණෙනි, ආකාශය වැසීයන වළාකුලු පටලය මෙන් ශරීරයෙහි බැඳෙන්නා වූ යම් බැඳීමක් ඇත්ද, භාත්පසින් ශරීරයේ බැඳියාමෙක් ඇද්ද, දුර්වලභාවයක් ඇද්ද, ශක්තියෙහි හින භාවයක් වෙත්ද, ශරීරයෙහි ක්‍රියාකාරීත්වය දුර්වලද, මේ චෛතසිකයන්ගේ මැළිගතිය නම් වන්නේය. යමෙක් කපි නිද්‍රවෙන් යුක්තවූයේ සර්වෝපහාර චිත්තය ඉක්මුනාවූ භවාංග සිතට නොපැමිණියා වූ විකීර්ණක චිත්තයෙන් නිද්‍රක්ෂය කෙරේද මේ මිද්ධයාගේ මධ්‍යය නම් වන්නේය. සිත භවාංග ගතවීම මිද්ධයාගේ පරියොසානය නම් වන්නේය. "රජතුමනි, නිදිසිත මධ්‍යගත වූ කපිනිද්‍රවෙන් යුක්ත වූ පුරුෂයා සිහින දකින්නේය. යම් සේ සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්තවූ ප්‍රථම ධ්‍යානයෙන් සංහිඳුනා වූ සිත් ඇති වාචෝද්ගතව ස්ථිරව සිටියාවූ පර්යොප්ති ධර්මයන් ඇති ස්ථිර වූ ප්‍රඥාව ඇති ප්‍රහීණ වූ ආනර්ය කථා සල්ලාප ශබ්ද ඇති කිසියම් ශ්‍රාවකයෙක් විවෙක රමණීය වූ වනගතව එකචාරී කෙශරසිංහ රාජයකුසේ හැසිරීමෙන් සුඛුම වූ අර්ථචින්තනය කරන්නේය. ඒ ආර්ය ශ්‍රාවක තෙම එම වනයෙහි නින්දට නොයන්නේය. සංහිඳුනා වූ එක් සිත් ඇති ඒ ආර්යය ශ්‍රාවක තෙම එම වනයෙහි හිඳ සියුම් වූ අර්ථය ප්‍රතිවෙධය කරන්නේය."

"මහ රජාණනි, එපරිද්දෙන්ම නිදිවර්ජිත වූ නින්දට නොපැමිණියා වූ මඳ මඳ නින්දට පැමිණියා වූ වඳුරු නින්දෙන් යුක්ත වූ පුද්ගලයා සිහින දකින්නේය. අනාර්ය වූ කොතුහල ශබ්දය යම් සේද, එමෙන්ම

නිදි වැළකීම දැනගත යුතුය. විවේක රම්‍යවූ විචිත්‍ර වනාන්තරය යම් සේද, එමෙන් කපි නින්දෙන් යුත් පුද්ගලයා දැනගතයුතු වේ. ඒ ආර්ය ශ්‍රාවක තෙම නිශ්ප්‍රයෝජන කථා, සල්ලාප ශබ්ද හැර, සිතෙහි මැළි ගතිය ඉවත්කොට මධ්‍යස්ථ වූයේ සියුම් වූ අර්ථයෙන් යුක්ත වූ රහත්ඵලය යම් සේ ප්‍රතිවේධය කෙරේද, එමෙන් නිදි වැළකීමෙන් යුක්ත වූ තද නින්දට නොපැමිණියාවූ වඳුරු නින්දට පත්වූ එම නින්දෙන් යුක්ත වූ පුරුෂයා සිහින දකින්නේය. එසේ දකින සිහිනද පූර්ව නිමිති වශයෙන් පසේ නදි කොසොල් රජතුමා ආදි වශයෙන් දුටු සොළොස් සිහිනාදිය සෙයින් සත්‍යය" යි වදාළ සේක. "යහපති ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මෙසේ මේ ප්‍රශ්නයත් එසේම පිළිගනිමි" යි සතුට ප්‍රකාශ කර සිටියේය.

නිමි.

## අකාල මරණ ප්‍රශ්නය

මෙම මාහැඟි අකල් මරණ ප්‍රශ්නයත් මෙම ග්‍රන්ථයට ඇතුලත් කරන්නේ වර්තමාන කාර්යබහුල සමාජයට ලොකු දහම් පොත් තබා මෙවන් කුඩා ග්‍රන්ථයක්වත් කියවා ධර්මඥානය ලබා ගැනීමටවත් කාලවේලාවක් නොමැති නිසාත්, එසේ වුවත් ධර්මයට ගරුකරන බොහෝ අය තවමත් අප සමාජයේ සිටින නිසා, ඒ අයගෙන් යමෙක් මතු උපදින පරපුර වෙනුවෙන් හෝ යමක් කළාය කියන බලාපොරොත්තුව මත සටහන් කරමි.

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යම් සත්වයෙක් මරණයට පත් වන්නේද, ඒ මේ සියළු සත්වයෝම නියමිත කාලයෙහිම මැරෙනවාද? එසේ නැතිනම් අකාලයෙහිත් මැරෙනවාද?" යි විචාළෝ ය. "මහරජතුමනි, නියම ආයුෂ විඳ මැරෙන අයත් සිටිති. එසේම අකල් මරණයන්ට පත්වන අයත් සිටිති." යි වදාළ සේක. "එසේනම් ස්වාමීනි, ආයුෂ

ගෙවා මැරෙන්නේ කවුද? අකාලයේ මැරෙන්නේ කවුද?" "මහරජ තොප විසින් අඹ - දඹ - කොස් - පොල් ආදි ගස්වලින් නොපැසුනා වූ ද, පැසුනා වූ ද, වැටී තිබෙන ගෙඩි දැක තිබේද?" "එසේය ස්වාමීනි දැක තිබේ." "මහරජතුමනි, යම් ඒ ගෙඩි වර්ග ගසෙන් බිමට වැටෙන්නා වූද, එම සියළු ගෙඩි වර්ග කාලයෙහිම වැටෙන්නෙහිද, නැතිනම් අකාලයෙත් වැටෙත්ද?" "ස්වාමීනි, නාගසේනයන් වහන්ස, පැසුනු, ඉඳුනු, වියළුනු, ගෙඩිවර්ග නියමිත කාලයෙහිම වැටෙන්නාහ."

"අවශේෂ වූ ගෙඩි එල ආදිය සතුන් විසින් කාදැමීමෙන්, පණුවන් විදීමෙන්, වැටෙන්නාහ. තවත් කොටසක් ගල්, පොලු, වැදීමෙන් වැටෙන්නාහ, තවත් කොටසක් සුළංවේගයෙන් සෙළවී වැටෙන්නාහ, තවත් කොටසක් ඇතුලත කුණු වීමෙන් වැටෙන්නාහ. ඒ සියළුම එලදාව අකාලයෙහිම වැටෙන්නාහුය" යි කිහ. "රජතුමනි, එපරිද්දෙන් ම, යම් ඒ සත්වයෙක් ජරා වේගයෙන් නසින ලද්දා හු වැටෙත්ද, එම සත්වයෝම කැළයෙහිම මැරෙන්නාහුය. අවශේෂ වූ සත්වයන් අතුරෙන් ඇතැම් කෙනෙක් තමන් පෙර කළ අකුසල කර්මයාගේ දරුණුකමේ හේතුවෙනුත් මැරෙන්නාහුය" යි වදාළ සේක. "ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් උපවෙජාදාදි කර්මප්‍රතිබාධයෙන් මරණයට පත් වන්නේද, තවත් කෙනෙක් යාත්‍රාදි ප්‍රතිවිරුද්ධතාවෙන් මරණයට පත්වන්නේද, තවත් කෙනෙක් විෂමාහාර සෙවන උදක පතනාදි ක්‍රියා විරෝධයෙන් තවත් සත්වයෙක් ජරාවේගයෙන් පිඩිතවත් මැරෙන්නාහුද, ඒ සියල්ලෝම කාලයෙහිම මැරෙන්නාහ. යමෙක් මව්කුස පිළිසිඳ ගත්තේද මැරෙන්නේය. ඔහුගේ ඒ ආයුෂකාලයයි. කාලයෙහිම එතෙම මැරෙන්නේය. යමෙක් මව් කුසින් බිහි වූ විගසම මරණයට පත්වන්නේය. ඔහුගේ ආයුෂ එපමණයි. ඉපදී ටික දිනකින් නසින්නේද එම සත්වයාගේ ආයුකාලය එපමණයි. තවත් කෙනෙක් ඉපදී අවුරුද්දෙන් නසින්නේය. තවත් කෙනෙක් අවුරුදු 70-80-90-100 ආදි වශයෙන් ගෙවා මැරෙන්නේය. ඔවුන්ට එය කාලය නම් වන්නේය. එම කාලයෙහිදීම ඔහු නසින්නේය." "ස්වාමීනි,

නාගසේනයන් වහන්ස, ඒ කාරණයෙන් අකාලයෙහි මරණයක් නම් නොවන්නේය. යමෙක් නසිත්නම් ඒ සියල්ලෝම කාලයෙහිම නසින්නාහුය" යි කීහ.

"මහරජතුමනි, ඉදිරියට ආයුෂ තිබියදීත්, මොවුන් හත් දෙනෙක් අකාලයෙහි මැරෙන්නාහ. කිනම් ආකාරයෙහි හත් දෙනෙක්ද?" යත්, "මහරජතුමනි, කුසගින්නෙන් පීඩිත වූ පුරුෂයෙක් ආහාර නොලද්දේ කුසගිනි වේගයෙන් දවන ලද අභ්‍යන්තරය ඇතිව ඉදිරි ආයුෂ තිබියදිද, අකාලයෙහිම මැරෙන්නේය." "මහරජතුමනි, පිපාසයෙන් පීඩිත වූ පුරුෂයෙක් (පැන්නො ලබනුයෙ) වියලුනාවූ හෘදය ඇතිව මතු ආයුෂ තිබියදිද අකාලයෙහිම මරණයට පත්වන්නේය. සර්පයෙක් දෂ්ඨ කරන ලද්දා වූ විෂ වේගයෙන් පීඩිත වන ලද්දා වූ පුරුෂයාද ප්‍රතිකර්ම නොලබනුයේ ඉදිරි ආයුෂ තිබියදීත් අකාලයෙහිම මැරෙන්නේය. තවද මහරජතුමනි, වස - විෂ අනුභව කරන පුරුෂයා ශරීරය විෂ තේජසින් දැවෙන විට ප්‍රතිකාර නොලැබීමෙන් තව ඉදිරියට ජීවත් වීමට ආයුෂ තිබුනත් අකාලයේ මැරෙන්නේය" "මහරජාණෙනි, යම් හෙයකින් ශරීරයට ගිනිගත්තොත් ගින්නෙන් පිළිස්සෙන ඔහු එම ගිනි නිවීමක් හෝ නිසි ප්‍රතිකර්මයක් නොමැති කමින් ආයුෂ තිබියදී අකාලයේ මරණයට පත්වන්නේය. එසේම මහරජතුමනි, ගැඹුරු ජලයට පැමිණියාවූ පුරුෂයා ගොඩයාමට පිහිටක් නොලදින් මතු ආයුෂ ඉතිරිව තිබියදී අකාලයේ මිය යන්නේය." "මහරජාණෙනි, ශූසත්‍රයෙන් (කඩු කිනිසි ගිනි අවි) ප්‍රහාර ලද්දා වූ එම හේතුවෙන් ආබාධිත වූ පුරුෂයා අකාලයේ මිය යන්නේය. මහරජාණෙනි, මොවුන් හත් දෙනා තව ජීවත් වීමට ආයුෂ තිබුනත් අකාලයෙහිම මැරෙන්නාහ."

"මහරජතුමනි, එම මරණයෙහිද මම එක් කාරණයක් නොකියමි. අට ආකාරයකින් සත්වයන්ගේ මරණය වන්නේය. වාත සමුට්ඨානයෙන්ද, පිත්ත සමුට්ඨානයෙන්ද, සෙම්හ සමුට්ඨානයෙන්ද, සන්නිපාතයෙන්ද, සෘතු පරිවර්තනයෙන්ද, විෂම පරිහරණයෙන්ද, උපක්‍රමයෙන්ද, කර්ම

විපාකයෙන්ද, යි යන මේ අට ප්‍රාකාරයෙන් සත්වයන්ගේ කාලක්‍රියාව සිදුවන්නේය." "මහරජතුමනි, එම අෂ්ටවිධ වූ කාලක්‍රියාවන් අතුරෙන් යම් මේ කර්ම විපාකයෙන් වන කාලක්‍රියාවක් ඇත්ද, එම කාල ක්‍රියාවම ඒ කාලක්‍රියා අතුරෙන් කාලයටම වන්නා වූ සාමයික කාලක්‍රියාවය. අවශේෂ වූ කාලක්‍රියාවෝ අසාමායික කාලක්‍රියාවෝය. එපවත් පහත සඳහන් ගාථාවෙන් දැක්වෙන්නේය."

"දිගච්ඡාය පිපාසාය - අහිනාදට්ඨො විසෙනචා
අග්ගි උදක සත්තිහි - අකාලෙ තත්ථ මියති
වාත පිත්තෙන සෙම්හෙන - සන්නිපාතෙනුතූහිච,
විසමොපක්කමතුමෙවහි - අකාලෙ තත්ථ මියති" යි

මෙහි අර්ථය මෙසේයි :-

කුසගින්නෙන්, පිපාසාවෙන්, සර්ප විසෙන් වසවිසෙන්, ගින්නෙන්, ජලයෙන්, ආයුධයෙන් ද, යන මේ සත් ආකාරයෙන් අකාලයේ මිය යනු ලැබේ. වාතයෙන්ද, පිත නරක් වීමෙන්ද, සෙම නරක් වීමෙන්ද, උණ සන්නිපාතයෙන්ද, ඍතු විපර්යාසයෙන්ද, විෂමොපක්‍රම ක්‍රියාවෙන්ද, යන මේ සත් ආකාරයෙන්ද අකාලයෙහි මරණයට පත්වනු ලැබේ. මේවාටද අකාල මරණයයි කියනු ලැබේ.

"තවද මහරජතුමනි, ඇතැම් අය පෙරකළ ඒ අකුසල කර්ම විපාකයෙන් මරණයට පත්වන්නාහ. මේ ලෝකයෙහි යමෙක් අතීතයෙහි අනුන් කුසගින්නේ තබා මරවන්නේය. (අජාසත් රජ) එම සත්වයා නිරයෙහි ඉපිද අනන්ත අප්‍රමාණ දුක්විඳ යම් දිනක මිනිස්ලොව උපන්නේ නම්, ඉතා දිනව (කිසිවෙකුගේ අවධානයක් නැතිව) විරූපව, කුසගින්නෙන් පීඩිතව, කුසගින්නෙන් පෙළෙනුයේ, සාදුකින් කලන්තව, වියළි මළානික වූ හෘදය ඇතිව සාගින්නේ වියළි අධික කුසගින්නේ දැවෙනුයේ බොහෝ අවුරුදු සිය දහස් ගණනක් කලාන්තයෙහි අධික

දුක් විඳිමින් ළදරු වයසේ හෝ මධ්‍යම වයසේ වුයේද, මහළු වුයේද, ආහාර නොලදින් අධික කුසගින්නෙහිම මැරෙන්නේය. මේ පෙර ජාතිවල කළ පවු ඇත්තා වූ ඔහුගේ කාලකර්ම වූ සාමයික මරණය නම් වන්නේය.''

යමෙක් අතීතයෙහි අන්‍යයන් හට පිපාසාව නිවාගැනිමට පැන් නොදී පිපාසාව ඇතිකර එම පිපාසාවෙන්ම මරන්නේය. (L T T අලිමන්කඩ) ඔහු සතර අපා දුක් විඳ කාල නියමයක් නැති අතිදීර්ඝ කාලයකට පසු මිනිසත් ආත්මභාවයක් ලදනම් නිජ්ක්ධාමතණ්හික (ජීර්ණවූ රුක්සිදුරු ඇවිලගත් ගින්දර සෙයින් කුසතුල ඇවිල දවන්නා වූ ගිනිජාලාවෙන් දැවි දැවී මහදුක් අනුභව කරන්නා වූ) ප්‍රේතයකු සමානව මනුෂ්‍ය ප්‍රේතව වියළි රුක්ෂ සමාන වූ ශරීර ඇතිව පිපාසයෙන් වියලුනා වූ ශරීර ඇතිව බොහෝ අනේක වර්ෂ සියදහස් ගණනක් මහදුක් විඳ තරුණ, මධ්‍යම, මහළු වුයේද, පිපාසාවෙන්ම මැරෙන්නේය. ඒ පෙරකළ පවු ඇත්තා වූ ඔහුගේ මේ සාමයික මරණයට නම් වන්නේය.

යමෙක් පෙර ආත්මභාවයකහෝ මෙම ආත්මභාවයේදී හෝ සර්පයන් ලවා දෂ්ඨකරවා මරවන්නේය. ඔහු ද මරණින් මතු අති දීර්ඝකාලීනව නිරයේ මහදුක් විඳ ඉන්පසු තිරිසන් යෝනිගතව අනන්ත අප්‍රමාණ ආත්මවාර ගණනින් වෙනත් සතුන්ගේ සහ ප්‍රාණඝාතය කරන මිනිසුන්ගේ ගොදුරු බවට පත්වන වාර ගණනක් කිව නොහැක. දාරපිඹුරු සර්පාදීන්ට ගොදුරුව පිඹුරු මුඛයෙන් පිඹුරු මුඛයට, ගැරඬි මුඛයෙන් ගැරඬි මුඛයට, සර්පමුඛයෙන් සර්පමුඛයට පෙරළි පෙරළි ඇවිදිමින් යම් කලෙක මිනිසත් භාවයක් ලද්දේ ද, එම සර්පාදීන් විසින් ලේ පෙර පෙරා කඩා කන ලද්දේම බාල, තරුණ, මධ්‍යම, මහළු වුයේද සර්පයන් විසින් දෂ්ට කරන ලද්දේම මරණයට පත්වන්නේය. පවු කලා වූ ඔහුගේ මේ සාමයික මරණය නම් වන්නේය.

යමෙක් අතීතයෙහි අනුන්ට වස විස දී මැරුවේ නම් (ඇල, දොල, ගංගා ආදියෙහිද) ඔහු හෝ ඇය නිරයෙහි වැටී අනන්ත දුක්

විඳවාත් ඉන්පසු ප්‍රේත අපායෙහි ඉපිද ගිනිගෙන දැවෙන්නා වූ අංගෝපාංගයන් ගෙන් බොහෝ අවුරුදු ලක්‍ෂ - කෝටි - ප්‍රකෝටි ගණන් ප්‍රේත දුක් විඳ කිසියම් දවසක මනුෂ්‍ය ආත්මභාවයක් ලදත් මනුෂ්‍ය ප්‍රේතයන් සේ තැනින් තැන කුණුව, කැඩුන-බිඳුන ශරීරයෙන් යුතුව සර්වජන පිළිකුලට බඳුන්ව කුණු ගඳ හමනුයේ ජීවත්ව මැරුණුයේද, සෙසු මනුෂ්‍යයන්ට අප්‍රසන්න භාවයෙන් යුක්තවය. ඔහුගේ එම මරණයද සාමයික මරණය නම් වන්නේය.

යමෙක් පූර්වයෙහි අනුන් ගින්නෙන් මැරුවේ නම් ඔහු ගිණි අඟුරු නිරයෙහි ඉපදී මහ ගිනි ජාලාවෙන් පිළිස්සී - පිළිස්සී දැවි - දැවී මහා හඬින් හඬ හඬා අංගාර පර්වතයට නගිමින් බසිමින් සජීවයක් සෙයින් නොමැරි - මැරි - මැරී කර්ම බලයෙන් නොමැරී යමපල්ලන්ගේ යම් විෂයෙන් - යම් විෂයට පැමිණ දීර්ඝ කාලාන්තරයක් කර්ම දුක් ගෙවා මිනිසත් ආත්මභාවයක් ලදත් අධික දැවිල්ලෙන්ම කල් යවා මැරුණත් ගින්නෙන්ම මරණයට පත්වන්නේය. එයද ඔහුගේ සාමයික මරණය නම් වන්නේය.

යමෙක් අතීතයෙහි අනුන් ජලයෙන් මැරුවේ නම්, ඔහු මරණින් මතු නිරාදුක් විඳ මිනිසත් බවට පත්වූයේද, විරූපව නැසුනු - සිඳුනු - බිඳුනු දුර්වල වූ ශරීර ඇතිව අති දීර්ඝකාලීනව මහදුක් විඳිමින් නොයෙක් ආකාරයෙන් භයින් චලිත වන ලද සිත් ඇතිව ජීවත් වූයේ තමන් පෙරකළ පාපකර්ම අකුසල බලයෙන් ගංගා - ඇලදොළ - වැව් - පොකුණු - ළිං ආදියෙහි හෝ කුඩා දරුවන්ව සිට නාන බේසම්තුල හෝ ගිලී ජලයෙන් ම මැරෙන්නේය. මෙයද ඔහුගේ සාමයික මරණය නම් වන්නේය.

යමෙක් පෙර අවි ආයුධ බලයෙන් යමකු ප්‍රාණඝාතයට ලක්කළේ නම් ඔහු අතිදීර්ඝ කාලාන්තරයක් අටමහා නරකාදි වල අනේකවිධ වදවේදනා විදවාත් එම පාපකර්මය ගෙවා අවසන්කරගත නොහැකිව,

තිරිසන් යෝනියෙහි ඌරු - මුව - ගෝන මෘග - කර්කටක - කුක්කුටාදි ආත්ම භාවයන් හි ඉපිද ආයුධ වලින් නොයෙක් ආකාරයෙන් කැපෙමින්, කැඩෙමින් තුවලා ලබමින් මැරී මැරී තව තවත් එම ආත්ම භාවයන්හිම ඉපිද මැරෙමින් කිසියම් කලෙක මිනිසත් බවක් ලබත්ද? අනේක වාරගණන් අර මුලදී ආයුධයෙන් මරපු පාපකර්මයේ විපාක වශයෙන් උපදින - උපදින වාරයක් පාසාම අවි ආයුධ වලින්ම මරණයට පත්යන්නේය. මෙයද ඔහුගේ හෝ ඇයගේ සාමයික මරණය නම් වන්නේය. මෙවන් මරණ කාල මරණයෝය.

"ස්වාමීනි, නාගසේනයන් වහන්ස, අකාලමරණයක් ඇතැයි කියා ඔබවහන්සේ යමක් වදාළ සේක්ද? එහි මට ඔබ වහන්සේ කාරණයක් දන්වා වදාළ මැනව" යි කීහ.

"මහරජතුමනි, යම් සේ භාත්පසින් ගිනිගෙන දිලිසෙන්නා වූ මහත් වූ ගිනිජාලාවක් සතු වියළී ගිය තණකොළ රොඩු දරකොටන් ඇත්තේ ක්ෂයව ගියාවූ ආහාර ඇත්තේ ගිනි පෙණෙලි අවසන් වීමෙන් නිවී යන්නේය. අවසන් උනාවූ එම අනුපද්‍රව වූ ගිනිජාලාව කාලයටම නිවී ගියේයයි කියනු ලැබේද? මහරජතුමනි, එයාකාරයටම යම් කිසිවෙක් දීර්ඝ කාලයක් නිරෝගිව ජිවත්ව ජරාවෙන් ජිර්ණව ආයුෂ අවසන් වීමෙන් අනුපද්‍රවම නිරුපද්‍රවම මරණයට පත් වේද, එතෙම කාලයෙහිම මරණයට පැමිණියේ යයි කියනු ලැබේ."

"තවද මහරජාණෙනි, යම් සේ ග්‍රහණය කරණ ලද තෘණ - කාෂ්ට - ශාඛා රොඩු කුණු ඇති මහත් වූ මහා ගිණිගොඩක් වුයේද, එම අග්නි ස්කන්ධය නොහොත් ගිණි ජාලාවට පිළිස්සී අවසන් නොවූ අමුද්‍රව්‍ය තිබියදිම මහත් වූ වර්ෂාපතනයක් අවුත් එම ද්‍රව්‍යය තෙමී නිවී ගියේනම්, කිමෙක්ද? මහරජාණනි, එම අග්නි ජාලාව කාලයෙහිම නිවුනාද?" යි අසා වදාළ සේක. "නැත ස්වාමීනී" යි කීහ. "රජතුමනි, මුලින් වූ ගිණිකඳ හා පසුව ආ ගිණිකඳ හා සමාන නොවන්නේද?"

"ස්වාමීනි, ආගන්තුක වූ මහා මේඝයෙන් ප්‍රතිපීඩිතවන ලද්දා වූ එම අග්නි ස්කන්ධය අකාලයෙහිම නිවෙන ලදී." යි කීහ. "මහ රජාණෙනි, එපරිද්දෙන්ම යම්කිසිවෙක් අකාලයෙහි මියේද, ඔහු ආගන්තුක වූ රෝගයෙන් ප්‍රතිපීඩිතව නසින්නේය."

"මහරජතුමනි, වාත සමුට්ඨානයෙන් හෝ පිත්ත සමුට්ඨානයෙන් හෝ සෙම්හ සමුට්ඨානයෙන් හෝ සන්නිපාතයෙන් හෝ සෘතු විපර්යාසයෙන් හෝ විශමපරිහාරයෙන් හෝ උපක්‍රමිකයෙන් හෝ කුසගින්නෙන් හෝ පිපාසාවෙන් හෝ සර්පයන් දෂ්ඨ කිරීමෙන් හෝ වස විෂ අනුභව කිරීමෙන් හෝ ගින්නෙන් හෝ ජලයෙන් හෝ අවි ආයුධයෙන් හෝ ප්‍රතිපීඩිතවන ලදුව අකාලයෙහිම මරණයට පත් වන්නේය. මහරජාණනි, යම් කාරණයකින් අකාල මරණයක් ඇතැ යි කීම්ද මේ මෙහි එම කාරණය නම් වන්නේය. තවද මහරජාණෙනි, යම් සේ අහසෙහි මහත් වූ වැසිවලාවක් නැග නිම්න ස්ථාන එලස්ථාන පරිපූරණය කෙරෙමින් වැසි වසින්නේ නම් එම මහා මේඝය අනුපද්‍රව නිරුපද්‍රව වසන්නේ යයි කියනු ලැබේද, මහරජාණෙනි, එපරිද්දෙන්ම යම් කිසිවෙක් බොහෝ කලක් ජීවත්ව ජරාවෙන් ජිර්ණ ආයුෂ ගෙවීමෙන් දුබල වූයේ නිරුපද්‍රව වූයේ මියයන්නේද, එතෙම කාලයෙහිම මරණයට පැමිණියේය" යයි කියනු ලැබෙයි.

"තවද මහරජාණෙනි, යම් සේ ගගන තලයෙහි මහවැසි වලාවක් නැග මහත්ව හමන්නා වූ මහාවාතයෙන් විනාශයට යන්නේය. කුමක්ද? මහරජාණෙනි, එම වැසිවලාව කාලයෙහිම පහවන ලදනම් වේද?" යි විචාල සේක. "නැත ස්වාමීනී, කුමක් පිණිස පසුව නැගිවලාව පූර්ව නැගි වැසිවලාව සමගතික නොවූයේද? ස්වාමීනි, ආගන්තුකවූ වාතයෙන් පීඩිත වන ලද්දා වූ ඒ වලාහකය අසමයට පැමිණියේම පහව ගියේය." යි කීහ. "මහරජාණෙනි, එපරිද්දෙන්ම යම්කිසිවෙක් අකාලයෙහි මියේද, එතෙම ආගන්තුක වූ රෝගයෙන් පීඩිතව වාත සමුට්ඨානයෙන් හෝ පිත්තාදි සමුට්ඨානයකින් හෝ ආයුධයකින් හෝ පීඩිතව අකාලයෙහි

මරණයට පත්වන්නේය. මහරජාණෙනි, මෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණයෙක් ඇතැයි කීවේද, මෙය එම කාරණාවය"

"තවද රජතුමනි, යම් මහත් බල ඇත්තා වූ කෝපයට පත් වූ විසකුරු සර්පයෙකු යමෙකුට දෂ්ට කළේ නම් එම පුරුෂයාගේ අනිතික අනුපද්‍රව වූ එම විෂය ඔහු මරණයට පමුණු වන්නේය. අනිතික අනුපද්‍රව වූ විෂය ඒ කෙළ පැමිණියේය" යි කියනු ලැබෙයි. එපරිද්දෙන්ම කිසිවෙක් බොහෝ කාලයක් ජිවත්ව ජරාජිර්ණව ආයුෂය ගෙවීමෙන් අනුපද්‍රව නිරුපද්‍රව මැරෙන්නේය. එම තැනැත්තා අනුපද්‍රව වූ නිරුපද්‍රව වූ ජිවිතයේ අවසානයට පැමිණියා වූ සාමයික මරණයට පැමිණියේය යි කියනු ලැබේ. "තවද මහරජතුමනි, යම්සේ උග්‍රවිෂ ඇති බලවත් වූ සර්පයෙකු විසින් දෂ්ට කරන ලද පුරුෂයෙකුට ඒ අතරෙහිම විෂ වෛද්‍යවරයෙක් බෙහෙතක් දී අවිෂය කළේ නම් රජාණෙනි, එම විෂය කාලයෙහි පහවන ලද නම් වන්නේද?" "නැත ස්වාමීනි, මහාරජාණෙනි, ඒ කුමක් පිණිස පශ්චිම වූ විෂය පළමු විෂය හා සමගතික නොවුයේද?" "ස්වාමීනි, ආගන්තුක වූ ඖෂධයෙන් පෙළෙන ලද විෂය අවසානයට පැමිණීම නැතිව ගියේය." "මහරජාණෙනි, එපරිද්දෙන් ම යමෙක් අකාලයෙහි මිය ගියේද, එතෙම ආගන්තුක වූ රෝගයෙන් ප්‍රතිපිඩිතව වාතසමුට්ඨානයෙන් හෝ පිත්තාදි සමුට්ඨානයකින් හෝ ආයුධ බලයෙන් හෝ පිඩිතව අකාලයෙහිම මරණයට පත්වන්නේය" "මහරජාණෙනි, මේ අකාල මෘත්‍යුයෙහි යම් කාරණයකින් අකාලයෙහි මරණත් ඇතැයි කියා කීයෙම්ද, ඒ මේ කාරණය වන්නේය."

"තවද මහරජාණෙනි, දුනු ශිල්පියෙක් යම් ඉලක්කයක් වෙත ඊයක් විදින්නේ ඔහුගේ එම ඉලක්කය වෙතම ඊතලය යන්නේය. එම හී සැරය අනුපද්‍රව නිරුපද්‍රව උවමනා තැනට ගියේ යැයි කියනු ලැබේද, රජතුමනි එපරිද්දෙන්ම යමෙක් බොහෝ කාලයක් ජිවත්ව ජරා ජිර්ණව ආයුෂ ගෙවීමෙන් ස්වාභාවිකවම මරණයට පත්වන්නේය. හෙතෙම අනිතිකව අනුපද්‍රව කාලයෙහිම මරණයට පැමිණියේය" යි

කියනු ලැබෙයි. "තවද මහරජාණෙනි, යම් සේ දුනු ශිල්පියෙක් හී සැරයක් පතනය කළේ නම් එම දුනුවායාගේ හී සැරය විදි සැනෙන්ම යම්කිසි ප්‍රබලයෙක් සැරය වළක්වා ග්‍රහණය කළෙනම්, කුමක්ද? මහරජාණෙනි, ගමන වූ පරිද්දෙන්ම යන එම හිසැරය ඉලක්කය කරා යාවිද?" නැත ස්වාමීනි යි කීහ.

"මහරජතුමනි, මොන හේතුවක් නිසා පළමු හී සැරය මෙන් දෙවෙනි හී සැරය ඉලක්කය කරා නොගියේද?" "ස්වාමීනි, දෙවෙනි ව විදි හී සැරයට ආගන්තුක බාධාවක් පැමිණි නිසා අරමුණ කරා යාමට නොහැකි වුනේය." "මහරජතුමනි, එපරිද්දෙන්ම යමෙක් අකාලයෙහි මියේද, එතෙම ආගන්තුක වූ ප්‍රතිපීඩිතව වාත සමුට්ඨානයෙන් හෝ පිත්තාදි සමුට්ඨානයකින් හෝ ආයුධයෙන් හෝ පීඩිතව අකාලයෙහි මියයන්නේය. මහරජතුමනි,මේ මෑතටුයෙහි යම් හේතුවකින් අකාලයෙහි මරණයක් ඇතැයි කීවේද, මෙම කාරණය වන්නේ ය."

"තවද මහරජාණෙනි, යමෙක් ලෝහමය ඝන්ටාරයක් වැනි යමක් ගසා ශබ්ද නගා කිසියම් සීමාවක් වෙත සංඥාවක් දෙන්නේය." "රජතුමනි, එපරිද්දෙන්ම කිසිවෙක් දීර්ඝකාලයක් අවුරුදු සිය දහස් කාලයක් පුරා ජීවත්ව ජරාජීර්ණව ආයුෂ ගෙවීමෙන් නිරුපද්‍රවම මරණයට පත්වේද, උපද්‍රව නැතිව අනුපද්‍රව වූ ඔහු කාලයෙහිම මරණයට පැමිණියේය. කිසිවෙක් ලෝහමය භාජනයකට යකඩ මිටියක් වන් යමකින් ගසන්නේ නම්, ඒ ගැසීම හේතුකොට ගෙන මධුර ශබ්දයක් නිකුත් වන්නේය. නිකුත් වූ එම ශබ්දය ඈතට නොගිය කල්හිම කිසිවෙක් එම ලෝහමය භාජනය ඇල්ලුවේ නම් අත තැබීම සමගම ශබ්දය නවතින්නේය." "රජතුමනි, එම ශබ්දය බලාපොරොත්තු වූ ආකාරයට පැතිර ගියේද?" "නැත ස්වාමීනි, මොන හේතුවක් නිසා පළමු ශබ්දය මෙන් විසිරී නොගියේද?" "ස්වාමීන් වහන්ස, එම ශබ්දය විසිරී යෑමට බාධා වුයේ අත තැබීම නිසයි. මහරජතුමනි, එපරිද්දෙන්ම යමෙක් අකාලයේ මියෙම්ද, ඔහු ආගන්තුක වූ රෝගයක් හේතු කොට

ගෙන වාත සමුට්ඨානයෙන් හෝ පිත්ත සමුට්ඨානයෙන් හෝ අවි ආයුධයෙන් විඳවන ලදුව හෝ අකාලයෙහි මරණයට පත්වන්නේය."

"මහරජතුමනි, යම් හේතුවකින් මෙම මරණයෙහි අකාල මරණයක් ඇතැයි කිවේද, ඒ මෙම කාරණය වන්නේය. යම් සේ යහපත් වූ කෙතක හටගන්නා වූ පැල - මුල් - ධාන්‍ය බීජ මනා ලෙස පවතින වර්ෂාව හේතුකොටගෙන ඝන වූ පතල වූ ආකීර්ණ වූ භෝගය වැඩෙන කලට මනාලෙස පැසීමට වන්නේය. එම ධාන්‍ය නිරුපද්‍රව අනුපද්‍රව කාලයට පැමිණියේ නම් වන්නේය." යි කියනු ලැබේ. "මහරජතුමනි, එපරිද්දෙන්ම යම් කිසිවෙක් බොහෝ දවස් අවුරුදු සිය දහස් කාලයක් ජීවත්ව ජරා ජීර්ණ වූයේ ආයුෂ ගෙවීමෙන් පීඩා උපද්‍රව නැතිවම කාලයෙහිම මරණයට පැමිණෙන ලදැයි කියනු ලැබේ. තවද මහරජතුමනි, ගොවිපොළෙහි හටගත්තා වූ ධාන්‍ය වර්ග ජලය නොමැතිව මැරුණේ නම් එම ධාන්‍ය කාලයටම පැසුනේ නම් වේද?" "නැත ස්වාමීනි, ඒ කුමක් නිසාද? පසුව වපුල ධාන්‍ය පෙර වපුල ධාන්‍ය මෙන් නොවූයේයි" විචාල සේක. "ස්වාමීනි, ආගන්තුක වූ උෂ්ණයෙන් ප්‍රතිපීඩිත වන ලද්දා වූ එම ධාන්‍ය නැසෙන ලදී." "මහරජාණෙනි, එපරිද්දෙන්ම කිසිවෙක් අකාලයෙහි මියෙත්ද, එතෙම ආගන්තුක ගත වූ රෝගයෙන් ප්‍රතිපීඩිතව වාත සමුට්ඨානයෙන් හෝ පිත්ත සමුට්ඨානයෙන් හෝ ආයුධ පීඩිතව හෝ අකාලයෙහි මැරෙන්නේය."

"මහරජතුමනි, මේ මරණයෙහි යම් හෙයකින් අකාලයේ මරණයක් ඇතැයි කියා මම කීවේ නම් ඒ මෙම හේතුව වන්නේය. රජතුමනි, ඔබ විසින් සම්පූර්ණ වූ තරුණ වූ ගොයමෙහි පණුවන් ඇති වී ගසමුල පටන් විනාශ කරන්නෝ යයි කියා ඇසුවානේද?" "සැබෑව ස්වාමීනි, එම කාරණය අපවිසින් අසන ලදී." යි කීහ. මහරජාණෙනි, එම ගොයම කාලයෙහි මැරුණාද? අකාලයෙහි මැරුණාද? යි විචාළ සේක. "ස්වාමීනි, අකාලයෙහි නැසුනේය. ස්වාමීනි, ඒ ගොයම් පණුවන් නොකෑවා නම් ගොයම නියමිත කාලයට හොඳට පැසී එන්නේය." යි

කීහ. "මහරජතුමනි, ආගන්තුක වූ උපඝාතයෙන් අස්වැන්න මැරෙන්නේය. එසේ මරණයට නොයන්නා වූ අස්වැන්න කපාගන්නා කලට යහපත්ව පැමිණේද? එසේය නාගසේනයන් වහන්ස." "මහරජාණෙනි, එයාකාරයටම යම්කිසිවෙක් අකාලයෙහි මියයත්ද, හෙතෙම ආගන්තුක වූ රෝගයෙන්, ප්‍රති පීඩිතව වාතයෙන් හෝ පිතෙන් හෝ ආයුධයකින් පීඩිතව හෝ මැරෙන්නේය." "මහරජාණෙනි, මෙම මරණයෙහි යම් හේතුවකින් අකාලයෙහි මරණයක් ඇතැයි කීවේද, මේ එම කාරණයයි."

"මහරජාණෙනි, තොප විසින් පලදාවෙන් ඒ - මේ අතට - දෙසට නැමුනා වූ සශ්‍රීකව පැසුනා වූ අස්වැන්නට ගල්වැසි නම් වූ වර්ෂාවක් පතිතව අස්වැන්න විනාශ කරන්නේය." යි කියා අසා තිබේද? "එසේය ස්වාමීනි, අප එම කාරණය අසා තිබේ. එසේම දැක තිබේ." "මහරජතුමනි, එම කරල් සෑදුණු ගොයම කාලයෙහි මැරුනද? එසේ නැතිනම් අකාලයේ මැරුණද?" "ස්වාමීනි, අකාලයේ නැසුනේය. ස්වාමීනි, එම අස්වැන්න කර්කෂක වර්ෂාව නොවැස්සේ නම් සුදුසු ප්‍රයෝජනයට ගන්නා තත්වයට එන්නේය. මහරජතුමනි, ආගන්තුක වූ උපඝාතනයෙන් ගොයම විනාශ වන්නේය. විනාශයක් නොමැති ගොයම නියම සුදුසු තත්වයට පැමිණෙන්නේද?" යි විචාළ සේක. "එසේය ස්වාමීනි" යි කීහ. "රජතුමනි, එපරිද්දෙන්ම යමෙක් අකාලයෙහි මියේද, ඔහු ආගන්තුක වූ රෝගයකින් පීඩිතව වාතයෙන්, පිතෙන්, සෙම්කිපීමෙන් හෝ උණ සන්නිපාතයෙන් හෝ ඍතු විපර්යාසයෙන් හෝ විෂම පරිහරණයෙන් හෝ ආත්ම පරෝපක්‍රමයකින් හෝ කුසගින්නෙන් හෝ පිපාසාවෙන් හෝ සර්පයන් දෂ්ට කිරීමෙන් හෝ වස - විස අනුභව කිරීමකින් හෝ ගින්නෙන් හෝ ජලයෙන් හෝ අවි ආයුධයෙන් අකාලයෙහිම මිය යන්නේය. එසේනම් ආගන්තුක වූ රෝගයකින් පීඩිත නොවූයේ නම් කාලයෙහිම මරණයට පත්වන්නේය." "මහරජතුමනි, යම් හෙයකින් මේ මරණයෙහි අකාල මරණයක් ඇතැයි කීවේද, ඒ මේ කාරණය වන්නේය" යි වදාළ සේක.

"සාදු ! සාදු ! සාදු ! ස්වාමීනි, නාගසේනයන් වහන්ස, ප්‍රශ්න විසඳා වදාළ ආකාරය ඉතා ආශ්චර්ය වන්නේය. සාදු ! සාදු ! ස්වාමීනි, නාගසේනයන් වහන්ස, ප්‍රශ්නය විසර්ජනය කර වදාළ පරිදි ඉතා අත්භූත වන්නේය. මනෝනන්දනීය වූ කරුණු කාරණා යහපත් කොට දක්වන ලද්දේය. අකාලයෙහි මරණ ඇතැයි කියා සැහැල්ලු කරන ලද්දේය. ප්‍රසිද්ධ කරණ ලද්දේය. ස්වාමීනි, සිත නැත්තා වූ වික්ෂිප්ත වූ මිනිසෙකු දු එක එක උපමාවකින්ම අකාලයෙහි මරණ ඇතැයි කියා නිෂ්ඨාවට යන්නේය. සිත් සහිත වූ මා වැනි මනුෂ්‍යයකු නිෂ්ඨාවට යන බව කියනුම කවරේද? ස්වාමීනි, මට පළමු වදාළ උපමාවෙන්ම අකාලයෙහි මරණ ඇතැයි කියා අවබෝධ වූයෙමි. එතකුදු වුවත් නැවත නැවතත් ප්‍රකාශ කිරීම අසනු කැමතිව නොපිළිගත්තෙමි. අද මෙම ප්‍රශ්නය විසඳා වදාළ ආකාරයට භාග්‍යවත් අර්හත් ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන සේක් නම්, ශ්‍රී හස්තය දිගුකොට ඔබ වහන්සේගේ සිරස මත පිරිමදිමින් සාදුකාර දෙන සේක. සාදු ! සාදු ! ස්වාමීනි, මෙම ප්‍රශ්නයත් එසේම පිළිගන්නෙමි." යි ස්තෝත්‍ර කළහ.

නිමි.

**පසුවදන**

මෙම මාහැඟි දහම් ග්‍රන්ථය සම්පාදනය කරනු ලැබුයේ ලග්ගල කිවුලවාඩිය ශෛලබිම්බාරාම භාවනාශ්‍රමය 2009 අගෝස්තු මාසයේදී ය. එය නැවත පිටපත් කර මුද්‍රණය සඳහා යොමුකරන්නේ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමය, ගල්දුව, අම්බලන්ගොඩ 2014 සැප්තැම්බර් මාසයේදී ය.

විශේෂයෙන් මතක්කර දිය යුතු කරුණු කාරණා බොහෝ තිබුණත් කෙටියෙන් මතක් කර දෙන්නේ අකල් මරණ හතෙන් සඳහන් වෙනවා සා - පිපාසා දෙකෙන් කරගන්නා වූ අකුසල කර්ම මිනිසත් ආත්මභාවයේදී පමණක් බොහෝ දීර්ඝකාලීනව අවුරුදු සියදහස් ගනන් නොමැරී මැරී - මැරී කර්ම විපාක විඳින බව වර්තමානයේ ආයුෂ අවුරුදු 80 ටත් අඩුනම් සියදහස් ගණන් කියන්නේ මොනවාද කියා විචිකිච්ඡාවක් ඇතිකරගෙන මිත්‍යාදෘෂ්ටිගතව නීවරණය කරගෙන තව තවත් සසර දුකවැඩි කරගන්න එපා.

නවීන විද්‍යාව හැමදාම නවීනයි. අවුරුදු 50 න් පනහට එය වෙනස් වෙනවා. බුදු දහම ස්ථිරයි. එහි වෙනස්වීමක් අතීත - වර්තමාන - අනාගත නැත. එය සදාතනික විද්‍යාවකි. එදා මිළිඳු රජතුමාට නාගසේන මහරහතන් වහන්සේ විසින් ප්‍රශ්න විසඳා තිබෙන්නේ ඔරලෝසුවේ කටුව මෙන් සත්වයාගේ ආයුෂ අවුරුදු 10 සිට අසංඛ්‍ය දක්වා අඩු වැඩි වෙමින් පවතින නිසාත් සිය දහස් ගණනින් දේශනාකර වදාරා තිබුණත් ලක්‍ෂ කෝටි ගණනින් සඳහන්ව නැත්තේ එම කාල වකවානු තුල මනුලොව දෙව්ලෝ වලට වඩා සුබෝපභෝගී පින්වත් සත්වයන් බොහෝ සෙයින් සිටින කාලවකවානු නිසා බව මතක් කරමි.

තවද, මෙම ග්‍රන්ථයට ඇතුලත් පිපාසාවෙන් වන අකල් මරණ ගැන හොඳම ප්‍රසිද්ධ සිද්ධිය අලිමංකඩ හමුදා කඳවුර යටත්කර ගැනීමත්, එම යුධ උපක්‍රමය කරපු L. T. T. එක නැත්තටම නැතිවීමත් එයට සමානම වියට්නාම් යුද්ධයේදී ඇමරිකාව වියට්නාමයේ හද්ද පිටිසර දුගී දුප්පත් ගමක් වූ මිලාන් ගමේ හිටපු කුඩා දරුවාගේ සිට

මහල්ලා පමණක් නොව කුස තුල දරුවන් සිටින කාන්තාවන් පවා මරපු මිනිමරුවන්ට දඬුවම් නොදීම නිසා එය ආයුධයෙන් කල යුද්ධයක් නිසා බින්ලාඩන් ඒ වෙනුවට භාවිතා කළේ මගී ගුවන්යානා 3 ක්. එයින් එකක් නාසා ආයතනයටත්, දෙකක් ලෝක වෙළඳ මධ්‍යස්ථානයටත් පහරදී මිලාන් ඝාතනයේ කර්මවිපාකය දිට්ඨ ධම්මවේදනීය වශයෙන් ඉල්ලන් කෑම.

එසේම තවත් මිත්‍යාදෘෂ්ටි රාජ්‍යයක් වන ප්‍රංශය බුදු දහමේ පෙන්වන නොකටයුතු වෙළඳාමට අයත් ආයුධ වෙළඳාම වශයෙන් ඉරාක - ඉරාන යුදධය වෙනුවෙන් ඉරාක ජනාධිපති සදාම් හුසේන් ජනාධිපතිතුමාට දුන් පෝක්ලන්ත යුද්ධයේදී බ්‍රිතාන්‍ය සී පිල්ඩ් නැව විනාශ කරන ලද මිසයිල් සහ ඒවා ගෙනයන ගුවන්යානා විකුණා ඩොලර් ප්‍රකෝටි ගණන් ගත්තත් ප්‍රංශයේ දුගී පවුලක් මව - පියා - දරුවන් හත්දෙනාට ජීවත් වන්න ආදායමක් නැති නිසා පාන්ගෙඩියක් ගෙන පෙති නවයකට කපා එම පෙති නවයේම වස ගා පළමුව දරුවන් හත්දෙනාට කවා දෙවනුව අඹුසැමි යුවලත් කා නව දෙනාම මැරුණේ එම අයගේ පෙර ආත්ම භාවයක වස විසෙන් ප්‍රාණඝාත කරතිබීමේ අකුසලයක් සහ නොකටයුතු වෙළඳාම එම මිසයිල් සහ ගුවන් යානා ආජන්ටිනාවටද විකුණා මහ බලවතුන් බවට පත්වුනත් කර්ම විපාකය මෙලොව වශයෙන් ලැබීම සර්වබල දෙවියන් වහන්සේටවත් වලක්වා ගැනීමට නොහැකි විය.

ඒ කෙසේද? එම මිසයිල් පහරින් බ්‍රිතාන්‍ය සතු නාවික හමුදා භටයන් 1250 ක් සමගින් C. PEELD සි පිල්ඩ් නැමැති යුධ නැව පපඩමක් පොඩිකරන ආකාරයට සුළු මොහොතින් විනාශයට පත්ව මුහුදුබත් වීම. එම පුවත මුලු ලෝකයම මවිතයට පත් කළ අතර ප්‍රංශ ජාතිකයෝ සියුම් මාන්නයක් සමග සතුටක් භුක්ති වින්දේ මාසයක් පමණ කාලයකි. (අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේට විඩූඩය කුමාරයාගේ සිද්ධිය සහ සසර සැරිසැරීමේදී වැදි කොවුල් පවුලක

ඉපදීමේ විපාකය මෙනි.) ප්‍රංශයේ පෙරපාසල් ළමයින් හතලිස් දෙනෙක් බස්රියකින් විනෝද ගමනක් යාමේදී එම බස් රථය අනතුරකට පත්ව එහි සිටි ළමයින් 40 ක් සහ අනෙක් අයත් එතනම මියයාම. මෙම පුවත් ඉතිහාසයේ කුණු කූඩයට ගියත් බුදුදහම සමග සසඳා බලන කල සත්‍ය ජයගනී කියන කියමනත් නවීන විද්‍යාව පසුපස අදහාගෙන යන අයත්, ගැලවුම්කාරයෝ, පවු සමාකරන්නෝත් බොරු මායාවන් බව මේවායින් අවබෝධ කරගන්න පුළුවන් නම් මෙලොව පරලොව ජයගත්තා වෙනවා ඇත.

තවද ගින්නෙන් කරන මරණ ගැන දීර්ඝ විස්තරයක් ඇතුලත් කෙටි දහම් ග්‍රන්ථයක් වන "මෙණ්ඩක ප්‍රශ්නය" නමැති පොතෙන් මොනවට පැහැදිලි කර ඇත. කරුණු කාරණා එසේ නිසා දුකින් මිදීමේ දොරටුව බුදුසාසනය තුල මෙම අවස්ථාවේ විවෘතව තිබෙන නිසා අහෝ සසර දුකයි අහෝ සසර බියයි සසරින් මිදීමම සැපයි කියා සිතා අද මේ මොහොතේ පටන් සිතෙන්, කයෙන්, වචනයෙන් කරගන්නා වූ අකුසල් වෙනුවට සිතට පින් සිතිවිලි නංවාගෙන දාන - සීල - භාවනා - මෛත්‍රී - උපේක්ඛා සිතිවිලි උපදවා ක්‍රියා කරන මෙන් ඔබ සැමට මෙම දහම් පණිවිඩය මගින් දන්වා සිටිමි.

මීට,

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමය,
අම්බලන්ගොඩ.
24.09.2014

මෙත් වඩන    කෙනෙකුට
ලැබෙන අනුසස්    කැටිකොට
දෙසා ඇති    සූතුරට
අනුව දක්වමි කරුණු    මෙලෙසට

සැපසේ    නිදන්නට
සිහිනෙන් බිය    නොවන්නට
තුටින් පිබිදෙන්    නට
ලැබෙයි හැකි නම් මෙත්    වඩන්නට

මිනිසුන් පිය    කරති
අමනුස්සයොද පිය    වෙති
නිති දෙවියෝ    රකිති
ඒ නිසා මෙත් වැඩුම    යහපති

ගිනි මිස අවි    කියන
කිසිවකින් කයට    නොපෙළන
සිත එකඟ    කරවන
බලය හිමිවෙයි මෙයින්    නොමඳින

මුහුණ පැහැපත්    වෙන
සිහියෙන් යුතුව    මියයෙන
බඹලොවෙහි    ඉපදෙන
පින්කමකි දෙලොවටම    සැපදෙන

බුදු වදන්    පිළිගෙන
ලැබෙන අනුසස්    දැනගෙන
සිත පහදවා    ගෙන
මෙත් වඩමු අද පටන්    නිතියෙන

මුද්‍රණය :

සක්වා ප්‍රින්ටර්ස්
SAKVA PRINTERS
අංක 51/A, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
Tel / Fax : 091-2258756
E-mail : sakvaprinters@gmail.com